# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2023 ජූලි මස 31 වන දින |

## ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රථම මුදල් ප්‍රතිපත්ති වාර්තාව (2023 ජූලි) ප්‍රකාශයට පත් කරයි

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රථම මුදල් ප්‍රතිපත්ති වාර්තාව අද දින (2023 ජූලි මස 31 වැනි දින) ප්‍රකාශයට පත් කළේය.




[වමේ සිට දකුණට: සහකාර අධිපති ඒ. ආර්. කේ. විජේසේකර මහතා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහත්මිය, අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා, නියෝජ්‍ය අධිපති කේ. එම්. ඒ. එන්. දවුලගල මහත්මිය, අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර මහතා]

මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා වැදගත් පියවරක් වන අතර මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සලකා බලන ලද දත්ත සහ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම තුළින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම තවදුරටත් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

දේශීය හා ගෝලීය වශයෙන් වත්මන් සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ඒවායේ ඉදිරි දැක්ම විශ්ලේෂණය කිරීම මත පදනම්ව උද්ධමනය සහ අනෙකුත් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පිළිබඳව මහ බැංකුවේ ඉදිරි දැක්ම මුදල් ප්‍රතිපත්ති වාර්තාව මගින් ඉදිරිපත් කරයි. මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ තවත් අරමුණක් වන්නේ දැනට පවතින සහ අපේක්ෂිත ප්‍රවණතා සලකා බලමින් උද්ධමනය සහ ආර්ථික වර්ධනය පිළිබඳව සිදුකර ඇති පුරෝකථන සඳහා පවතින අවදානම් පිළිබඳ තක්සේරුවක් ලබා දීමයි.

එවැනි ඇගයීමක් මගින් මුදල් ප්‍රතිපත්ති තීරණවලට එළැඹීමේදී මුදල් මණ්ඩලයේ දැක්ම පිළිබඳව සියලු පාර්ශ්වකරුවන්ට වඩාත් පැහැදිලි අවබෝධයක් ලබා දීමට උපකාරී වනු ඇත.

මැදි කාලීන ආර්ථික පුරෝකථන යාවත්කාලීන කරනු ලබන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති විවරණවලට අනුකූලව මහ බැංකුව සෑම වසරකම ජනවාරි සහ ජූලි මාසවලදී මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කරනු ඇත. එලෙස මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීම මගින් මහ බැංකුව සියලු පාර්ශ්වකරුවන්හට දත්ත මත පදනම් වූ සහ ඉදිරි දැක්මක් සහිත තොරතුරු නියමිත කාලයට ලබා දෙනු ඇත. මෙමගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවන අතරම මහජනතාවගේ උද්ධමන අපේක්ෂා ස්ථායී කිරීමට සහාය වනු ඇත.

මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය නිවේදන, මාධ්‍ය සාකච්ඡා සහ මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ සහ මහ බැංකුවෙහි සමාජ මාධ්‍යවල පළ කෙරෙන අනෙකුත් ප්‍රකාශයන් ද ඇතුළු මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවලිය පිළිබඳ දැනට පවතින සන්නිවේදන ක්‍රියාමාර්ගයන්ට මෙම මුදල් ප්‍රතිපත්ති වාර්තාව ද ඇතුලත් වනු ඇත.

මාර්ගගත ප්‍රකාශනයක් වන මුදල් ප්‍රතිපත්ති වාර්තාව මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ පහත සබැඳියෙන් බාගත කරගත හැකිය.

https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථික-සහ-මූල්‍ය-වාර්තා/මුදල්-ප්‍රතිපත්ති-වාර්තා